**ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 16,583.78 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 13,223.11 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,360.67 ක් හෙවත් සියයට 20.26 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 3,012.35 | 2,869.12 | 143.23 | 4.75 |
| මූලධන | 13,571.43 | 10,353.99 | 3,217.44 | 23.71 |
| එකතුව | **16,583.78** | **13,223.11** | **3,360.67** | **20.26** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ 03 කින් හා දෙපාර්තමේන්තු 02 කින් රු.මිලියන 1,545.6 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,234.3 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 311.3 ක් හෙවත් සියයට 20.14 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයෙන් උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු රු. මිලියන 1,200.00 ක ප්‍රතිපාදිත මුදල ඉක්මවා රු. මිලියන 5.58 ක මුදලක් වැඩිපුර උපයෝජනය කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 28201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 148.00 | 147.80 | 105.00 | 138.39 | 500.0 | 365.90 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ පොදු තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 548.2 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0001/0022/000 | 12.09 |
| 6000/0000/00/0001/0041/000 | 4.04 |
| 6000/0000/00/0016/0008/000 | 266.61 |
| 6000/0000/00/0018/0010/000 | 1.27 |
| 6000/0000/00/0013/0036/000 | 264.27 |
| | **548.28** |

**2.4 විගණන නිරීක්ෂණය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| **(අ)** | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502(2) |
| **(ආ)** | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| **(ඇ)** | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| **(ඈ)** | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**3.2 විගණන සාක්ෂි නොවීම**

දෙපාර්තමේන්තුවෙන් බාහිර ආයතන වෙත ලබා දුන් මෝටර් වාහන 43 ක් පිළිබඳ තොරතුරු 2017 ජූලි 31 දින දක්වාම විගණනය වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම**

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 02 කට අදාලව 2017 ජූලි 31 දින වන විට ද පිළිතුරු ලබා දී නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.6,382,768 ක් වී තිබුණි.

## 3.4 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පදනම් කරගෙන අවශ්‍ය අග්‍රිම සීමාව සඳහන් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. එම සීමාවන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. අනුමත කල සීමාවන් අනුව ඒ ඒ මාසවල අපේක්ෂා කළ පරිදි අග්‍රිම මුදල් දෙපාර්තමේන්තුව වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොතිබීම නිසා වැය විෂයන් 16 ක් යටතේ සැලසුම් කළ කාර්යයන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

**(ආ)** සංවර්ධන වැඩසටහන යටතේ රුගම්- කිතුල් ජලාශය ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 50.00 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 45.00 ක් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණු අතර ඉතිරි රු.මිලියන 5.00 ක් වූ ප්‍රතිපාදනය ම ඉතිරි වී තිබුණි.

**(ඇ)** ඇස්තමේන්තුවට වඩා සත්‍ය වියදම අඩුවීම, කැලෑ එළි කිරීමට පමාවීම, ඉදිකිරීම් කටයුතු ඊලග වර්ෂයට කල් දැමීම යනාදී හේතු දක්වමින් 2016 වර්ෂයේ දී ඉල්ලුම්පත් 03 ක් උපයෝගී කරගෙන මුදල් රෙගුලාසි 66 යටතේ ඒ ඒ වැය විෂයන් අතර ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු. මිලියන 2,131.85ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන නොතිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

------------------------

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. මිලියන 55.52 ක්වූ තැන්පතු 83 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------

විෂය අංක 28201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 24,174,162 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.365,904,846 ක් වූ අතර දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.365,833,685 ක් ලෙස රු.71,161 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සාමාජික ණය ලේඛනවල දැක්වෙන කේවල ශේෂ වටිනාකම සහ අත්තිකාරම් ගිණුම සමග ඉදිරිපත් කළ කේවළ ශේෂ වටිනාකම අතර රු.782,729 ක වෙනසක් තිබුණි.

## 3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

**අභ්‍යන්තර විගණනය**

---

ප්‍රධාන කාර්යාලය හා කලාප කාර්යාල 14 කින් සහ ස්ථිර කාර්ය මණ්ඩලය 6,159 කින් සමන්විත වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යයන් විගණනය කිරීමට අභ්‍යන්තර විගණන අංශයට කාර්යය මණ්ඩලය 19 දෙනෙකු අනුමත කරගෙන තිබුණද තථ්‍ය කාර්ය මණ්ඩලය 11 ක් විය. ඒ අනුව විගණන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතර පුහුණුවීම් ලබා දීමට ද කටයුතු කර නොතිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රත්මලාන නිල නිවාස යෝජනා ක්‍රමයට අයත් නිල නිවාස පිළිබඳව සිදු කරන ලද භෞතික පරීක්ෂණයේ දී භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින නිවාස 23 ක් නිෂ්ක්‍රීයව තිබුණි.

**(ii)** 2014 ජූනි 10 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දෙපාර්තමේන්තු ලිපිකරුවෙකු අනිවාර්ය නිවාඩු යවා තිබුණි. කිසිදු පරීක්ෂණයක් සිදු නොකර එදින සිට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අවුරුදු 2 කුත් මාස 07 ක කාලය සඳහා වැටුප වශයෙන් රු.1,300,566 ක මුදලක් නිශ්කාර්යව ගෙවා තිබුණි. ඔහුගේ විනය ක්‍රියා පටිපාටිය අවසන්වීමට පෙර ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14:12 වගන්තියට පටහැනිව රු.149,158 ක හිග වැටුප් වර්ධක ද ලබා දී තිබුණි.

**(iii)** වීරකැටිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ තොග පොත අනුව 1991 වර්ෂයේ සිට 2015 සැප්තැම්බර් මාසය දක්වා ගබඩාවට ලැබී තිබුණු භාණ්ඩ අයිතම 28 ක් නිකුත් නොකර නිෂ්කාර්යව තිබුණි.

**(ආ)** **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, වාරිමාර්ග කාර්යාල 02 ක වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** 2016 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් සහ වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි**.**

**(ඇ)** **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

බාහිර ආයතනවල සේවය කරන පුද්ගලයින් 40 දෙනෙකු සහ දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකු නිල නිවාසවල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. එවැනි නිල නිවාස 30 ක් නැවත ලබා ගැනීමට නඩු පවරා තිබුණි.

**(ඈ)** **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතනවලින් ලැබී තිබුණු වාහන 131 ක් දෙපාර්තමේන්තුව වෙත විධිමත් පරිදි පවරා ගැනීමට 2017 ජූලි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ඉ)** **බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු. මිලියන 2,311.91ක් වූ අතර, එම වටිනාකම වර්ෂයකට වඩා අඩු කාලපරිච්ඡේදයකට අදාළ වූ අතර පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 94 විධිවිධාන ප්‍රකාරව දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය එම වර්ෂයේ ප්‍රතිපාදනය නොඉක්මවිය යුතු වුවත් ශුද්ධ ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.57,250,561 ක බැරකම්වලට දෙපාර්තමේන්තුව එළඹ තිබුණි.

(ii) රු.21,233,349ක්වූ බැරකම් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(iii) යාන් ඔය ව්‍යාපෘති සංවර්ධන වැඩ සටහන යටතේ රු.2,244,717,477 ක් වූ බැරකම්වලින් සියයට 86 ක් හෙවත් රු.1,989,083,923 ක මුදලක් විදේශීය සමාගමකට ගෙවිය යුතුව තිබුණි. එම වැය විෂය යටතේ රු.2,013,839,824 ක ශුද්ධ ඉතිරිවීමක් තිබිය දී බැරකම ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 447(4) විධිවිධාන ප්‍රකාරව සියලුම වියදම් වැය ලෙජරයේ දැක්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එකඟවී තිබුණු සියලුම බැරකම් වලට අදාළ වියදම් විස්තර වැය ලෙජරයට ඇතුළත් කර නොතිබුණි.

## 3.9 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) පාර්ලිමේන්තු පනත්** | | |
| 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත | - | පොළොන්නරුව වාරිමාර්ග කලාපයට අයත් ගිරිතලේ සංචාරක බංගලාව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යාවරයා ඔහුගේ පෞද්ගලික කටයුතු සඳහා 2015 ඔක්තෝබර් 02 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ගෙවීමකින් තොරව භාවිතා කර තිබුණි. |
| **(ආ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා** | | |
| 2013 ඔක්තෝබර් 11 දිනැති අංක 13/1166/508/017 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව | - | කොන්ත්‍රාත් පදනම යටතේ දීර්ඝ කාලයක් සේවය කරන ලද නිලධාරීන් 169 දෙනෙකු කොත්මලේ සහ ගල්ගමුව අභ්‍යාස ආයතනයන් හි NVQ 05 මට්ටමේ පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබුණි. අදාල සහතිකය ලබා ගැනීමෙන් පසුව එම අවස්ථාවට පමණක් සීමාවන පරිදි තාක්ෂණ සහායක තනතුරට බඳවා ගැනීමට 2013 ඔක්තෝබර් 11 දිනැති අංක 13/1166/508/017 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් නියෝග කර තිබුණි. කෙසේ වුවද, 2017 ජුලි 31 දින දක්වා ම එම නියෝගය පරිදි කටයුතු කර නොතිබුණි. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

**-------------------------------------------**

| | | |
|---|---|---|
| **(i)** V වැනි පරිච්ඡේදයේ 7:1 වගන්තිය | - | නිවාඩු ලබා නොගෙන නොදන්වා ගණකාධිකාරීවරයෙකු 2015, 2016 සහ 2017 වර්ෂවල දී දින 192 ක් සේවයට වාර්තා කර නොතිබුණ ද ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ii)** XIX වැනි පරිච්ඡේදයේ 7 සහ 9 වගන්තිය | - | දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරීන්ට ලබා දී තිබුණු නිල නිවාස ඔවුන් මිය ගිය හෝ විශ්‍රාම ගිය ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ වුව ද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විශ්‍රාම යාමේ දී, ස්ථාන මාරුවීමේ දී සහ මිය යාමෙන් පසු දෙපාර්තමේන්තුව වෙත නිල නිවාස කඩිනමින් නැවත ලබා ගැනීමේ සක්‍රීය වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව සතු නොවීය. |
| **(iii)** XIX වැනි පරිච්ඡේදයේ 4:2:1වගන්තිය | - | නිලධාරියා / සේවකයා පමණක් නිල නිවාසවල පදිංචිව සිටින අවස්ථා 12 ක් නිරීක්ෂණය වූ අතර එම නිල නිවාසවල පදිංචි තනි පුද්ගලයින් සාද නිවාසවලට යොමු කිරීමට හෝ ආයතන සංග්‍රහයේ XIX ඡේදයේ 4:2:1 වගන්තියේ සදහන් ලකුණු දීමේ පදනම මත නිල නිවාස ලබා දීමට හෝ දෙපාර්තමේන්තුව අවධානය යොමු කර නොතිබුණි. |

**(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

**-------------------------------------------**

| | | |
|---|---|---|
| **(i)** මුදල් රෙගුලාසි 207(1) | 443,619 | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම එම මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වැය කිරීමේ අධිකාරී බලය ඉකුත් වුවද ඊට පටහැනිව 2016 වර්ෂය සඳහා වූ ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ අවස්ථා 11 ක දී මිලදී ගැනීම් සිදු කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | **(ii)** මුදල් රෙගුලාසි 207(3) | 305,541 | වැය විෂයයන් සඳහා වාර්ෂික වියදම් ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදන ඒවා වෙන් කර තිබුණු නිශ්චිත අරමුණු ඉටුකරගැනීම සඳහා භාවිතා කල යුතුය. එසේ වුව ද අවස්ථා 07 ක දී ප්‍රතිපාදන වෙන් කර තිබුණු අරමුණුවලින් පරිබාහිරව මුදල් වැය කර තිබුණි. |
| | **(iii)** මුදල් රෙගුලාසි 445 | - | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල සහ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල පවත්වාගෙන යා යුතු ලිපි ගොනු හා ලේඛන යාවත්කාලීනව හා නිවැරදිව පවත්වා ගෙන ගොස් නොතිබුණු බව අභ්‍යන්තර විගණන විමසුම්වලින් පෙන්වා දී තිබුණි. එම දුර්වලතා සහ අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| **(ඉ)** | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006** | | |
| | **(i)** 5:4:1 මාර්ගෝපදේශය | 1,292,336 | එකතු කළ අගය මත බදු ගෙවීමේ දී එකතු කළ අගය මත බදු ඉන්වොයිසියක් ලබා ගෙන ගෙවීම් කළ යුතු වුව ද ඉන්වොයිසියක් නොමැතිව වවුචර් 6 ක් මගින් එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. |
| | **(ii)** 5:4:12 මාර්ගෝපදේශය | 4,310,624 | එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ විස්තර ඊලග මාසයේ 15 වන දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට දැණුම් දිය යුතු නමුත් 2014 සිට 2017 වර්ෂය දක්වා ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබදව එපරිදි කටයුතු කර නොතිබුණි. |

**3.10 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

පෙතියාගොඩ ජල පොම්පාගාරය සහ ඇල්ලේ වැව ජලාශය ඉදිකිරීම සඳහා ඉකුත් වර්ෂයේ පිළිවෙලින් රු.50,000,000 ක් හා රු.30,000,000 ක් හා සමාලෝචිත වර්ෂයේ දී රු.50,000,000 බැගින් ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද එම ඉදිකිරීම් සමාලෝචිත වර්ෂයේ දී ද ආරම්භ කර නොතිබුණි.

**3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 03 ක් විසින් නඩත්තු කර තිබුණු බැංකු ගිණුම් 04 ක් 2007 දෙසැම්බර් 04 දින, 2013 දෙසැම්බර් 31 දින, 2014 ජනවාරි 31 දින සහ 2016 සැප්තැම්බර් 30 දින සිට අක්‍රියව තිබුණි.

**(ආ)** බැංකු ගිණුම් 11 කට අදාල එකතුව රු.160,788 ක් වූ චෙක්පත් 18 ක් නිකුත් කර මාස 06 ක් ඉකුත් වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) අනුව කටයුතු කර නොතිබුණි.

**(ඇ)** 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.10,195,180 ක් වූ හඳුනානොගත් "හර" ශේෂ 29 ක් සහ එකතුව රු.170,065 ක් වූ හඳුනානොගත් "බැර" ශේෂ 07 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර බැංකු සැසඳුම්වල දක්වා තිබුණි.

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ)** ජල ශක්ති අංශයේ සේවය කර 2002 මැයි 09 දින අනිවාර්ය විශ්‍රාම ගන්වන ලද ගබඩා භාරකරුවකුගේ 2002 වර්ෂයට පෙර සේවා කාලයේ දී සිදු වී තිබුණු මිණුම් උපකරණ ඌනතාවයේ වටිනාකම රු.4,313,239 ක් ලෙස වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් පවරන ලද නඩුවේ තීන්දුව අනුව රු.411,051 ක මුදලක් පමණක් ඔහුගෙන් අය කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට ද 2017 ජූලි 31 දින දක්වා ම අපොහොසත් වී තිබුණි. වර්ෂ 14 කට පෙර සිදු වී තිබුණු මෙම ඌනතාවය අය කර ගැනීම සඳහා නිසි පසුවිපරමක් සිදු කර නොතිබුණි.

(ආ) විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සුදුසුකම් මත බඳවා ගන්නා ලද ඉංජිනේරුවරයකුගේ සුදුසුකම් සනාථ කර ගැනීම සිදු කර නොතිබුණු අතර වරලත් ඉංජිනේරුවරයෙකු බව ප්‍රකාශ කර තිබුණ ද එළෙස නොවන බව විගණනයේදී අනාවරණය විය. මේ අනුව බඳවා ගැනීමේ දී සහ උසස්වීම් ලබා දීමේ දී සුදුසුකම් සනාථ කරගෙන නොතිබුණි.

## 3.13 පාඩු හා හානි

---------------

අවස්ථාවන් 85 කට අදාළ රු.3,865,424 ක හානි හා පාඩු පොත්වලින් කපා හැර තිබුණ අතර රු.7,682,799 ක හානි හා පාඩු අය කර ගැනීමට මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. වර්ෂ 19 ක සිට 36 ක් දක්වා කාලයක් ගත වී තිබුණු රු.481,291 ක මුදල් වංචාවන් 02 ක් 2017 ජූලි මස වන විටත් අය කරගෙන නොතිබුණි.

## 3.14 විසඳා නොතිබුණු විගණන ඡේද

---------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් අක්‍රමිකතාවයන් හා ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමු ගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2006 | 3.1 (අ) | සුගලා දේවි වැව ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු සහකාරවරයෙකු සිදු කර ඇති අක්‍රමිකතා. |
| 2006 | 3.1 (ආ) | වෙලිඔය ව්‍යාපෘතිය යටතේ සිදුව ඇති අක්‍රමිකතා. |
| 2006 | 2.4.1 | ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කර දේපළ ණය ලබා ගැනීම. |
| 2006 | 7.2 (අ) | වෙහෙරගල ව්‍යාපෘතිය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ලබා ගැනීම. |
| 2008 | 7 (ඇ) (1) | වාහනයක් අනතුරට පත්වීම නිසා රු.210,000 ක අලාභයක් සිදුවීම. |
| 2011 | 2.8 | සංචාරක බෝට්ටු සේවාවක් පවත්වාගෙන යාම. |
| 2015 | 3.12 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ට පටහැනිව කටයුතු කිරීම. |
| | 3.13 | ස්ථිර පත්වීම් ප්‍රදානය සඳහා කූඨ ලේඛන සැකසීම. |

## 3.15 කළමනාකරණ දූර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනත සහ වරින්වර එයට සිදු කර ඇති සංශෝධන වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) රත්මලාන නිවාස සංකීර්ණයේ සේවකයන් 6 දෙනෙකු සඳහා වෙන් කර තිබුණු නිල නිවාස 06 ක අනවසර ඉදිකිරීම් කර තිබුණු අතර එම නිල නිවාසවල බාහිර පුද්ගලයින් ද පදිංචි වී සිටින බවට තොරතුරු අනාවරණය විය.

(ඇ) කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.මිලියන 545.00 ක් වූ ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද ඊට අදාල ශක්‍යතා අධ්‍යයනයක් සහ පාරිසරික අධ්‍යයනයක් සිදු කර නොතිබුණි.

(ඈ) පුත්තලම වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් ගෙවන ලද එකතු කළ අගය මත බදු දෝෂ සහිතව ගණනය කිරීම නිසා රු.30,648 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) වීරකැටිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා පුද්ගලයන් සහ ආයතන සමග අවස්ථා 07ක දී ගිවිසුම්ගත වී දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද අදාල කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 25 දෙනෙකුට එරෙහිව විනය පරීක්ෂණ ක්‍රියාත්මක කර තිබුණ ද එම පරීක්ෂණ කටයුතු අවසන් වී නොතිබීම නිසා අදාල නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හැකි වී නොතිබුණි.

**3.16** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**---------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 433 | 300 | 133 | - |
| (ii) | තෘතියික මට්ටම | 180 | 24 | 156 | - |
| (iii) | ද්විතියික මට්ටම | 2,752 | 1,948 | 804 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,774 | 3,887 | - | 1,113 |
| | | **6,139** | **6,159** | **1,093** | **1,113** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1,093ක් තිබුණි. 2016 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණ ද එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් කර තිබුණි.

**(ii)** ප්‍රාථමික මට්ටම සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 1,113 ක් බඳවාගෙන තිබුණි.